අද, දෙසැම්බර් 01, 2022, ලෝක ඒඩ්ස් දිනයයි.

ඒඩ්ස් සහ එච්.අයි.වී. පිළිබඳව වාර්තා කිරීමේදී ඇතැම් මාධ්‍ය ඒඩ්ස් සහ එච්.අයි.වී. යන යෙදුම් දෙක, ඒවායේ කිසිදු වෙනසක් නොදකිමින් භාවිතා කරන බව Ethics Eye අපි මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. පහත පුවත් වාර්තාවන් ඊට නිදසුන් වේ.

* දිනමිණ (දෙසැම්බර් 01, 2022):

සිරස්තලය: "හඳුනා නොගත් ඒඩ්ස් රෝගියෝ 700ක් සමාජයේ"
අන්තර්ගතය: "...හඳුනා නොගත් එච්.අයි.වී. වෛරසය ආසාදිත පුද්ගලයින් 700 ක පමණ..."

* දිවයින (දෙසැම්බර් 01, 2022):

සිරස්තලය: "ගම්පහත් ඒඩ්ස් වැඩිවෙලා"

අන්තර්ගතය: "ගම්පහ දිස්ත්‍රික්කයේ එච්.අයි.වී. ආසාදිතයින් 86 දෙනෙකු..."

1) මෙසේ බෝ විය හැකි වෛරසය වන "එච්.අයි.වී." සහ එම වෛරසය ඔස්සේ අවසානයේ ඇති වන රෝගී තත්වය වන "ඒඩ්ස් රෝගය" එකක් ලෙසින් සලකමින් වාර්තා කිරීම, එච්.අයි.වී./ඒඩ්ස් පිළිබඳ වාර්තාකරණයේ නිරවද්‍යභාවය පිළිබඳ ගැටළු ඇති නොකරන්නේ ද?

2) එය, එච්.අයි.වී./ඒඩ්ස් සම්බන්ධයෙන් වැරදි අදහස් සමාජගත වීමට ද හේතුවක් නොවන්නේ ද?

3) මෙසේ සිරස්තලය තුළ එච්.අයි.වී./ඒඩ්ස් සම්බන්ධයෙන් වැරදි තොරතුරු සඳහන් වීමට හේතුව, මාධ්‍යවේදීන් විසින් වාර්තා කරනා පුවතකට බොහෝ විට සිරස්තල යොදන්නේ පුවත් කර්තෘවරුන් වන නිසා ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා ගැටළුකාරී මාධ්‍ය වාර්තාකරණයන්/ආචාර ධාර්මික මාර්ගෝපදේශ කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) ඔස්සේ අපට එවන්න.